# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

AAT/89/2022 (NPC)

ඩබ්.ඒ.ඩී.පී.ජයලත්
**අභියාචක**
**එදිරිව**
ජාතික පොලිස් කොමිෂන් සභාව
**වගඋත්තරකරු**

**දිනය :-2026.05.13**

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

පෙනී සිටීම :- අභියාචක වෙනුවෙන් විශ්‍රාමික රජයේ සේවක ඩී.එස්.වික්‍රමසිංහ මහතා,
වගඋත්තරකාර ජාතික පොලිස් කොමිෂන් සභාව වෙනුවෙන් නියෝජ්‍ය අධ්‍යක්ෂ මාලා බස්නායක මහත්මිය.

## -<u>නියෝගය</u>-

## විනිසුරු කේ.ටී.චිත්‍රසිරි මැතිතුමා

අභියාචක ඩබ්.ඒ.ඩී.පී.ජයලත් යන අය විසින්, **2022.12.09** වෙනි දින ඉදිරිපත් කර ඇති අභියාචනා පෙත්සම මගින් ඉල්ලා ඇත්තේ, ඔහුට එරෙහිව ලබා දී ඇති විනය නියෝගය අවලංගු කර, ඉදිරිපත් කර තිබූ චෝදනා වලින් ඔහුව නිදහස් කර දෙන ලෙසයි. එකී විනය නියෝගය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින්, **2022.10.27** දිනැති ලිපිය මගින් අභියාචක වෙත දැනුම් දී ඇත. එම ලිපියට අනුව, අභියාචක වෙත ඉදිරිපත් කර තිබූ චෝදනා **4**ක් සම්බන්ධයෙන් පැවැත්වූ විධිමත් විනය පරීක්ෂණයෙන් අනතුරුව, චෝදනා පත්‍රයේ සඳහන් චෝදනා **03** කට අභියාචක වරදකරු වන බවට තීරණය කර ඇත. ඒ අනුව ඔහුගේ වැටුප් වර්ධක **5**ක් විලම්භනය කිරීමටත්, තදින් තරවටු කිරීම නමැති දඩුවම පැනවීමටත් නියෝග කර ඇත.

ඉහත දක්වා ඇති පරිදි, අභියාචක වරදකරු බවට පත් කිරීමට හේතුවී ඇත්තේ, ඔහුට විරුද්ධව ඉදිරිපත් කර තිබූ චෝදනා **03**කට ඔහු වරදකරු බවට පත් කර තිබීමයි. එකී චෝදනා **03** එකම සිද්ධියක් මත පවරා ඇති අතර, ඒ

අනුව අපකීර්තිදායක හැසිරීම, රාජකාරිය පැහැර හැරීම සහ බොරු කීම හෝ ඇත්ත සඟවා කතා කිරීම නමැති, දෙපාර්තමේන්තු නියෝග වල සඳහන් වැරදි සිදුකර ඇති බවට සඳහන් කරමින් එම චෝදනා ඉදිරිපත් කර ඇත.

එකී චෝදනා සියල්ලටම පදනම් වී ඇත්තේ, අභියාචක දකුණු පළාත් නීති කොට්ඨාශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂක ලෙස සේවය කරමින් සිටියදී, පී.එච්.අනුර ප්‍රනාන්දු යන අය විසින් කරන ලද පැමිණිල්ලක් අනුව හම්බන්තොට මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරීමේ දී, නීතිපතිතුමාගේ උපදෙස් ලබා ගැනීමකින් තොරව චෝදනා පත්‍රය සකස් කර ඉදිරිපත් කර තිබීමයි.

ඉහත සඳහන් අන්දමට නීතිපතිතුමාගේ උපදෙස් නොගෙන සකස් කරන ලද චෝදනා පත්‍රය පිළියෙළ කිරීම සඳහා උපදෙස් ලබා දී ඇත්තේ අභියාචක විසිනි. ඒ ගැන විවාදයක් නැත. එසේ ලබා දුන් උපදෙස් විධිමත් විනය පරීක්ෂණයේ දී පැ.4 ලෙසට සළකුණු කර ඉදිරිපත් ඇති ලේඛනයේ සඳහන් ව ඇත. ඒ වන විටත්, මල්ෂානි කොෂල්‍යා කුමාරි වීරසූරිය සහ වැලිගමගේ සරත් ධම්මික පෙරේරා යන අයට විරුද්ධව දණ්ඩනීති සංග්‍රහයේ 403, 386 සහ 389 යන වගන්තීන් යටතේ සහ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ 64(අ) වගන්තිය යටතේ නඩු පවරා ඇති බවත්, ඊට අමතරව චූදිතයන්ට එරෙහිව ආගමන හා විගමන පනතේ 45 වගන්තිය යටතේ කටයුතු කිරීමේ හැකියාවක් තිබේද යන්න සළකා බැලීමට උපදෙස් දී ඇති බවටත් එහි සඳහන් වේ.

ඉදිරිපත් වී ඇති සාක්ෂි අනුව පෙනී යන්නේ ආගමන හා විගමන පනතේ විධිවිධාන අනුව චෝදනා ඉදිරිපත් කිරීම සඳහා ඇති හැකියාව සොයා බලා තීරණය කරන ලෙසට දන්වා ඇත්තේ මහේස්ත්‍රාත්තුමා විසින් බවයි. එම නියෝගය අනුව අභියාචක දැනුම් දී ඇත්තේ, පළවන චූදිත වන මල්ෂානි කොෂල්‍යා කුමාරි වීරසූරිය යන අයට එරෙහිව නඩුව පවත්වා ගෙන යාමට ප්‍රමාණවත් කරුණු නොමැති බවත්, ඒ අනුව දෙවන චූදිතට පමණක් දණ්ඩනීති සංග්‍රහයේ 389 වගන්තිය යටතේ වන චෝදනාව මත නඩුව පවත්වා ගෙන යා හැකි බවත් ය. ඉහතින් සඳහන් කරන ලද කරුණු අනුව මේ අවස්ථාවේ දී තීරණය කළ යුතු වන්නේ, අභියාචක විසින් ලබා දී ඇති ඉහත කී උපදෙස් මත ඉදිරිපත් කර තිබූ චෝදනා පිළියෙල කිරීමට පෙර ඒ සඳහා නීතිපතිතුමාගේ උපදෙස් ගැනීමට අවශ්‍ය වන්නේ ද යන කරුණයි.

පැ.13 ලෙස, විධිමත් විනය පරීක්ෂණයේ දී ඉදිරිපත් කරන ලද 2013.03.20 දිනැති ලේඛනය අනුව තංගල්ල විශේෂ අපරාධ විමර්ශනය අංශයේ ස්ථානාධිපති විසින් අභියාචක වෙතින් ඉල්ලා ඇති උපදෙස් වන්නේ, මෙම වරද ආගමන විගමන පනතේ 45 වගන්තිය ප්‍රකාරව කටයුතු කිරීමට හැකියාව ඇත්ද යන්න සම්බන්ධයෙන් මීළඟ නඩු දිනයේදී කරුණු ඉදිරිපත් කරන ලෙසට මහේස්ත්‍රාත්තුමා

විසින් දැනුම් දී ඇති හෙයින්, ඒ සම්බන්ධයෙන් මතයක් ප්‍රකාශ කරන ලෙසටය. එම නියෝගයේ මෙම කරුණ සම්බන්ධයෙන් නීතිපතිතුමාගෙන් කරුණු විමසා උපදෙස් ලබා ගන්නා ලෙසට කිසිදු සටහනක් නැත. ඒ සම්බන්ධව මහේස්ත්‍රාත්වරයා විසින් කරන ලද නියමය ඇතුළත් නඩු සටහන් වලටද විනිශ්චය අධිකාරයේ අවධානය යොමු කරන ලදි. එහි සඳහන් වන්නේ,

> "***මෙම නඩුවෙන් හෙළිවූ සාක්ෂි අනුව ආගමන හා විගමන පනතේ 45 වගන්තිය ප්‍රකාරව කටයුතු කිරීමට හැකියාව ඇත්ද යන්න සම්බන්ධයෙන් මීළඟ දින අධිකරණයට කරුණු දක්වීමට පැමිණිල්ලට නියම කරමි.***"

ආගමන හා විගමන පනතේ 45 වගන්තියට ද විනිශ්චය අධිකාරයේ අවධානය යොමු කරන ලදි. එහි සඳහන් වන්නේ එකී පනත යටතේ වන වැරදි මොනවාද යන්නයි. එකී 45 (III) උප වගන්තියේ වැඩිදුරටත් සඳහන් වන්නේ, 45 වන වගන්තිය යටතේ චෝදනා ඉදිරිපත් කළ හැක්කේ, විගමන පාලක හෝ සහකාර පොලිස් අධිකාරී නිලයෙන් පහළ නොවන නිලධාරියෙකුට පමණක් බවත්, ඒ සඳහා ආගමන විගමන පාලකවරයාගේ හෝ ඉහත කී පොලිස් නිලධාරියාගේ ලිඛිත අවසරයක් තිබිය යුතු බවත් ය. කෙසේ වෙතත් මෙහිදී වැදගත් වන්නේ ආගමන විගමන පනතේ විධිවිධාන අනුව හෝ දණ්ඩනීති සංග්‍රහය යටතේ, චෝදනා ඉදිරිපත් කිරීමට නීතිපතිතුමාගේ අනුමැතියක් අවශ්‍ය බවට මහේස්ත්‍රාත් නියෝගයේ සඳහන් නොවන බවයි.

අභියාචක 2004 වර්ෂයේ සිට ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු ලෙස දිව්රුම් දුන් බවටද ඔහු සඳහන් කර ඇත. ඊට අමතරව පොලිස් නිලධාරියෙකු ලෙස දීර්ඝ කාලයක් ඔහු සේවය කර ඇති අතර, 2011 සිට 2013 දක්වා දකුණු පළාත් නීති කොට්ඨාශයේ අධ්‍යක්ෂක ලෙසද කටයුතු කර ඇත. එවැනි පසුබිමක් යටතේ අභියාචක විසින් ඔහුගේ වෘත්තීය දැනුම උපයෝගී කරගෙන කිසියම් මතයක් ප්‍රකාශයට පත් කර ඇති අවස්ථාවක දී, එම මතය අභියෝගයට ලක් කිරීමට නම්, ඒ සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට බලය ඇති ආයතනයකට හෝ පුද්ගලයෙකුට ඉල්ලීමක් කර තිබිය යුතුය. මෙම අවස්ථාවේ දී එවැනි ඉල්ලීමක් සිදුකර නැත. මෙහිදී නැවත වරක් සඳහන් කළ යුතු වන්නේ, චෝදනා මොනවා විය යුතුද යන්න තීරණය කිරීමේ දී, අභියාචක විසින් චෝදනා ඒ ආකාරයෙන් ඉදිරිපත් කළහොත් ඇති විය හැකි ප්‍රතිඵල මොනවා විය හැකිද යන්න පරීක්ෂා කර ඇති බවත්, ඊට අමතරව එම තීරණය ලබා දීමේ දී, අභියාචක විසින් ඔහු සතු දැනුම හා පළපුරුද්ද උපයෝගී කරගෙන ඇති බවත් පෙනී යයි. ඒ හැරෙන්නට, වෙනත් බාහිර හේතුවක් මත එම තීරණයට එළඹුනේද යන්න තහවුරු කිරීමට සාක්ෂි කිසිවක් නැත.

ඉහතින් සඳහන් කරන ලද කරුණු අනුව පෙනී යන්නේ, චෝදනා ඔප්පු කිරීමට අවශ්‍ය අංගයක් වන, චෝදනා මොනවාද යන්න තීරණය කිරීමට පෙර, නීතිපතිතුමාගේ අනුමැතිය අවශ්‍ය යැයි කරනු ලබන සඳහන පිළිගත නොහැකි බවයි. එවැනි උපදෙසක් ලබාගත යුතු බව දක්වෙන පැහැදිලි නීතිමය තත්ත්වයක් හෝ රෙගුලාසියක් හෝ ඉදිරිපත් කිරීමට ජාතික පොලිස් කොමිෂන් සභාව පියවර ගෙන නැත. එවැනි තත්ත්වයක් යටතේ නීතිපතිතුමාගේ උපදෙස් නොමැතිව අභියාචක විසින් චෝදනා තීරණය කළාය යන කරුණු සනාථ වන්නේ නැත.

ඉහතකී කරුණු සළකා බලා, අභියාචක විසින් ඔහුගේ අභියාචනයෙන් කර ඇති ඉල්ලීමට අවසර ලබා දීමට තීරණය කරමු. ඒ අනුව අභියාචක වෙත ඉදිරිපත් කර තිබූ චෝදනා 03 න් ඔහු නිදොස් කර නිදහස් කිරීමට තීරණය කරමු. එකී චෝදනා මත නිකුත් කරන ලද විනය නියෝගයද අවලංගු කර අහෝසි කිරීමට තීරණය කරමු.

මෙම නියෝගය ක්‍රියාත්මක කර වාර්තා කරන ලෙසට ජාතික පොලිස් කොමිෂන් සභාවට නියෝග කරමු.

ඒ අනුව අභියාචක විසින් ඉදිරිපත් කර ඇති අභියාචනයට අවසර දීමට තීරණය කරමු.

අභියාචනයට අවසර දී ඇත.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි

එස්.නන්දසේකරන්
(සාමාජික)

ලලිතා/-